www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැතිවරනය පූර්න පරිමානව ජයග්‍රහනය කිරීමෙන් පසු නේපාල මාඕවාදියෝ ආයෝජකයන්ට සහ මහ බලවතුන්ට යලි සහතික වෙති

## After election landslide, Nepalese Maoists reassure investors and major powers

**කේ. රත්නායක සහ පීටර් සිමන්ඩ්ස් විසිනි**

**2008 අප්‍රේල් 18**

අප්‍රේල් 10 දා පැවති ව්‍යවස්ථා සම්පාදක මන්ඩල මැතිවරනයෙන් නේපාල මාඕවාදී කොමියුනිස්ට් පක්ෂය (සීපීඑන්- එම්) අනපේක්ෂිත පූර්න පරිමාන ජයග්‍රහනයක් ලැබීම පෙන්වා දෙන්නේ රටෙහි සමාජ අර්බුදයේ ගැඹුර සහ රාජාන්ඩුවට පමනක් නොව සංස්ථාපිතයේ සියලු පක්ෂ කෙරෙහි මහජනයා අතර පවතින වෛරය යි.

සංකීර්න මැතිවරන ක්‍රියාදාමයේ සමස්ත ප්‍රතිඵල සති ගනනාවක් යනතෙක් දැනගත නො හැකි වුව ද මාඕවාදියෝ ඍජුව තෝරා පත් කර ගැනෙන ආසන 240න් පැහැදිලි බහුතරයක් ජයගෙන ඇත. මේ දක්වා ප්‍රතිඵල නිකුත් කොට ඇති ආසන 218න් 116ක් මාඕවාදීන් ජයගෙන ඇත්තේ ඔවුන්ගේ ආසන්නතම ප්‍රතිවාදියා වන නේපාල කොංග්‍රසය අසුන් 34ක් පමනක් ද නේපාල එක්සත් මාක්ස්-ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂය (එන්සීපී- යූඑම්එල්) අසුන් 31ක් ද ලබා ගනිද්දී ය. වාර්ගික පදනමක් සහිත මදේසි ජනතා අයිතිවාසිකම් සභාව අසුන් 24ක් ජය ගත්තේ ය.

තවත් ආසන 335ක් සමානුපාතික ක්‍රමයට තීරනය කරනු ලැබෙන්නේ කාන්තාවන්ගේ, අඩු කුලයන්ගේ සහ සුලු වාර්ගිකයන්ගේ නියෝජනය සහතික කෙරෙන පරිදි ය. මාඕවාදීන්ට ලැබී ඇති සමස්ත ඡන්ද ප්‍රතිශතය සියයට 33ක් වන්නේ සීපීඑන්-එම්ආසන 601කින් යුත් නියෝජිත මන්ඩලයේ විශාලතම පක්ෂය බවට සහතික කරමින් වුවත් ඔවුන්ට බහුතරයක් ලැබෙන බවක් පෙනෙන්නට නැත. ඉතිරි ආසන 26 පත් කරනු ලබන්නේ සීපීඑන්-එම් ආධිපත්‍යය දරන අතුරු කැබිනට් මන්ඩලය විසිනි.

නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට මෙන් ම අන්තර්වාර ආන්ඩුවක් පත් කිරීමේ බලය ඇති ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් ස්ථාපනය කිරීමේ තීන්දුව දිග්ගැස්සුනු දේශපාලන අර්බුදයක නිෂ්පාදිතයකි. 2006 වසරේ අප්‍රේල් මාසයේ දී පරමාධිපතිවාදී රාජාන්ඩුවට එරෙහිව ඇදී ගිය විරෝධතා අවසානයේ ගයනේන්ද්‍ර රජුට පසුබැසීමටත් නේපාල කොංග්‍රසය හා එන්සීපී-යූඑම්එල් විසින් නායකත්වය දෙන ලද පක්ෂ හතක සන්ධානයකට බලය පැවරීමටත් බල කලේ ය. එම වසරේ නෙවැම්බරයේ දී මාඕවාදියෝ තම 12 අවුරුදු සන්නද්ධ අරගලය අවසන් කොට ඇමති මන්ඩලයට ඇතුලු වී ව්‍යවස්ථා සම්පාදක මන්ඩල මැතිවරනයකට තරඟ කිරීම සඳහා එකඟ වෙමින් ආන්ඩුව සමග සම්මුතියක් ඇති කර ගත්හ.

පසුගිය සතියේ පැවති මැතිවරනයේ ප්‍රතිඵලය නිරීක්ෂකයන්, දේශපාලන පන්ඩිතයන් සහ රාජ්‍ය තාන්ත්‍රිකයන්ව මවිතයට පත් කලේ ය. ජයග්‍රහනයේ පරිමානය පිලිබඳව වඩාත් ම පුදුමයට පත්වූයේ වෙනින් කවුරුවත් නොව මාඕවාදීන් ම ය. තීරනාත්මක ඉල්ලීම් ලබා නො දෙන්නේ නම් තමන් මැතිවරනයෙන් ඉවත් වන බවට සීපීඑන්-එම් තර්ජනය කල නිසා මැතිවරනය දෙවරක් කල් දමනු ලැබී ය. ඍජුව තෝරා පත් කර ගැනෙන ආසනවලින් බහුතරය තමන්ට නො ලැබේ යයි බියෙන් වඩා වැඩි සමානුපාතික අසුන් ප්‍රමානයක් අවශ්‍ය යයි මාඕවාදියෝ බල කල ද අවසානයේ ඔවුන්ට සම්මුතිකට එලැඹීමට බල කෙරුනි. අවසානයේ සීපීඑන්-එම් පක්ෂය තම ග්‍රාමීය බලකොටුවල පමනක් නොව කත්මන්ඩු සහ රටෙහි අනෙකුත් ප්‍රදේශවල ද විශාල ආසන ප්‍රමානයක් ජය ගත්තේ ය.

රාජාන්ඩුවට ඇති වෛරය ප්‍රතිඵලය කෙරෙහි පැහැදිලි ලෙස බලපෑ සාධකයකි. එම විරුද්ධත්වයේ ගැඹුර සිත් ගන්නාසුලු ලෙස ප්‍රදර්ශනය කෙරුනේ 2006 අප්‍රේල් මාසයේ දී දස දහස් ගනන් විරෝධතාකරුවන් ආරක්ෂක හමුදා නො තකා රජුට ඉල්ලා අස්වන ලෙස බල කරද්දී ය. ගයනේන්ද්‍රගේ ආඥාදායක පාලන ක්‍රම සහ වරප්‍රසාදිත ජීවන චර්යාව නිසා ඔහු සුවිශේෂීව වෛරයට පාත්‍ර වූ අතර ම බොහෝ ජනයා පරමාධිපතිවාදී රාජාන්ඩුවේ සමස්ත පද්ධතිය ම අවසාන විය යුතු ය යන නිගමනයට එලැඹුනු බවට සැකයක් නැත. මේ දක්වා කිසිදු රාජකීයවාදී පක්ෂයක් එකදු ඍජු අසුනක් හෝ දිනාගෙන නැත.

මැතිවරනයට පෙර ජනරජයක් ස්ථාපනය කිරීමේ යෝජනාවක් සම්මත කිරීමට බලයෙන් ඉවත්ව යන මන්ත්‍රී මන්ඩලයට බල කරමින්, රාජාන්ඩුව අහෝසි

කරන ලෙස වඩාත් ස්ථිරසාර ලෙස ඉල්ලා සිටි පක්ෂය වූයේ මාඕවාදීහු ය. මෙම යෝජනාව තහවුරු කිරීමට අවශ්‍ය එක ම දෙය වන්නේ අලුතින් පත්වන ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය ඡන්දයකින් එය සම්මත කිරීම පමනි. එය සංශෝධනයකින් තොරව තීන්දු කෙරෙනු ඇත. වඩාත් ප්‍රකටව ප්‍රචන්ඩ ලෙස හැඳින්වෙන සීපීඑන්-එම් නායක පුෂ්ප කමල් දාල් ගයනේන්ද්‍රට මසක් ඇතුලත බලයෙන් ඉවත් වී පුද්ගලික පුරවැසියකු බවට පත්වන ලෙස හෝ නැතහොත් ප්‍රතිවිපාක විඳීමට සූදානම් වන ලෙස අවසාන නිවේදනයක් නිකුත් කොට ඇත.

විශේෂයෙන් නේපාල කොංග්‍රසය හා වාමාංශික එන්සීපී-යූඑම්එල් පක්ෂය ඇතුලුව සංස්ථාපිතයේ දේශපාලන පක්ෂ ඡන්දදායකයන්ට පෙනී යන්නේ දූෂනය, රජුට වසර ගනනාවක් පුරා දේශපාලනිකව පක්ෂපාතවීම සහ රටෙහි දැවෙන සමාජ අර්බුදය විසඳීමට අසමත් වීම සමගින් කලු පැල්ලම් ගා ගත් ඒවා ලෙස ය. 1990 වසරේ පැවති මහජන විරෝධතා පාර්ලිමේන්තුවකට සීමිත ව්‍යවස්ථාමය බලතල ප්‍රදානය කිරීමට පූර්ව බිරේන්ද්‍ර රජුට බලකොට තිබුන ද අවසාන බලය සැමවිට ම රැඳී තිබුනේ හමුදාවේ සහයෝගය ලත් රාජාන්ඩුවේ හස්තයෙහි ය.

නේපාල කොංග්‍රසය සහ එන්සීපී-යූඑම්එල් යන පක්ෂ දෙක ම පසුගිය සතියේ මැතිවරනයේ දී අතුගෑවීමකට ලක්විය. හිටපු අන්තර්වාර අගමැති සහ නේපාල කොංග්‍රසයේ නායක ජී.පී. කොයිරාල තම අසුන රැක ගත්ත ද ඔහුගේ සහෝදරිය සහ හිටපු ස්වදේශ ඇමතිනිය වන ක්‍රිෂ්නා ප්‍රසාද් සිතුවාලා ඇතුලු මූලික පක්ෂ නායකයෝ පරාජය වූහ. තම අසුන පරාජයට පත් එන්සීපී-යූඑම්එල් නායක මාධව් කුමාර් නේපාල් සිය පදවියෙන් ඉල්ලා අස් විය. එම පක්ෂය පක්ෂ හතේ සභාගයෙන් ඉල්ලා අස්වීමට තමන්ට ඇති අභිප්‍රාය නිවේදනය කලේ ය.

වඩාත් අතිමූලිකව ගත්කල සමස්ත නේපාල දේශපාලන සංස්ථාපිතයට ම එරෙහි විරුද්ධත්වය පිලිබිඹු කරන්නේ ගැඹුරට විහිදුනු සමාජ අර්බුදයක් මෙන් ම මූලික ප්‍රජාතාන්ත්‍රික අයිතීන් නොමැතිකමකි. මිලියන 30ක ජනගහනයෙන් සියයට 31ක් නිල දරිද්‍රතා රේඛාවට පහලින් ජීවත් වේ. සාමාන්‍ය ඒක පුද්ගල ආදායම යන්තම් එක්සත් ජනපද ඩොලර් 280ක් වන අතර එය ලෝකයේ 12වැනියට අඩුම ආදායම යි. අසාක්ෂරතාව පවතින්නේ අපාලිත තත්වයක ය. ජනගහනයෙන් බහුතරය ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අතර පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා ඇතුලු මූලික පහසුකම් ඔවුන්ට අහිමි ය.

ඉහල නගින ගෝලීය ආහාර මිල වඩාත් ම දිලින්දන්ගේ ඉරනම වඩ වඩා නරක් කොට ඇත. ඉවුම් පිහුම් තෙල්වල මිල සියයට 50කින් ඉහල නැග ඇත්තේ යන්තම් මාස තුනක් ඇතුලත ය. සහල්, මස් සහ එලවලු මිල පිම්මේ ඉහල ගොස් තිබේ. එක් තක්සේරුවකට අනුව නේපාලයේ "අන්ත දුගී" මිලියන හතරක ජනයා තමන්ට ලැබෙන ආදායමෙන් සියයට 75කට වැඩි ප්‍රමාණයක් වියදම් කරන්නේ ආහාර සඳහා ය. රටෙහි කෘෂිකර්ම අංශවල ආයෝජනය පහල යමින් පවතී. අප්‍රේල් 2 දා පලකල ආසියානු සංවර්ධන බැංකු වාර්තාවක් යන්තම් සියයට 3.8ක වාර්ෂික වර්ධනයක් -- මෙය කලාපයේ අනෙකුත් රටවලට වඩා බෙහෙවින් පහල ය -- සහ සියයට 7ක උද්ධමන රේට්ටුවක් පුරෝකථනය කලේ ය.

## ධනේශ්වර න්‍යාය පත්‍රයක්

බොහෝ ඡන්ද දායකයන් මාඕවාදීන්ට සහයෝගය දැක්වූයේ ඔවුන් ප්‍රජාතාන්ත්‍රික පාලනයේ, සාමයේ සහ සමෘද්ධියේ නව කාල පරිච්ඡේදයක් උදාකරනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි. එහෙත් එම මිථ්‍යාවන් ඉක්මනින් ම බිඳී යනු ඇත. සියලු ජනතාවන්ට සියලු දෑ ලබාදීමට මාඕවාදීන් පොරොන්දු වී ඇතත් ඔවුන්ගේ වැඩපිලිවෙලේ හරිමැද පවතින්නේ ධනවාදවය දිගට ම පවත්වාගෙන යාමට ඇති කැපවීම යි. ස්ටැලින්වාදී අවධි දෙකේ න්‍යාය පිලිබඳව දැනුමක් ඇති කවරෙකුටවත් මාඕවාදී නායකයන්ගේ ප්‍රකාශ පුදුමයක් නො වේ. සීපීඑන්-එම් පක්ෂය තම "ධනේශ්වර ගොවිජන විප්ලවය" පදනම් කරන්නේ ග්‍රාමීය දිලිඳු ස්ථර මත මිස කම්කරු පන්තිය මත නො වේ. "පලමු අවධියේ" ප්‍රකාශිත අභිප්‍රාය වන්නේ රාජාන්ඩුව සහ කුල ක්‍රමය ද ඇතුලත්ව වැඩවසම්වාදයේ ඉතුරු පහඳු අතුගා දැමීම යිඃ ධනවාදය අහෝසි කිරීම නො වේ. සමාජවාදය ඈත අනාගතයට කල් දමා ඇත.

මැතිවරන ජයග්‍රහනයෙන් අනතුරුව ප්‍රචන්ඩ සහ තවත් ජ්‍යෙෂ්ට මාඕවාදියකු වන බබුරාම් භටාරායි ව්‍යාපාරික නායකයන්ට, විදේශ ආයෝජකයන්ට සහ මහ බලවතුන්ට ඔවුන්ගේ අවශ්‍යතා ආරක්ෂා කෙරෙන බවට සපථ කිරීමට කඩිනම් වූහ. "21 වන සියවසේ දී සංවර්ධනය සඳහා සියලු දෙනාගේ සහයෝගය අවශ්‍ය ය" යයි ප්‍රචන්ඩ ඉරිදා පැවසී ය. "අපට අපගේ අසල්වැසි ඉන්දියාව සහ චීනය ද ජාත්‍යන්තර ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන් ද සමග යහපත් සබඳතා අවශ්‍ය ය." නව ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට "සියලු පක්ෂ" සමගින් කටයුතු කිරීමට ඔහු පොරොන්දු විය.

නේපාල් ටයිම්ස් පුවත්පත සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී භටාරායි මෙසේ විස්තර කලේ යඃ " වැඩවසම්වාදය අවසන් කරනු ලැබිය යුතු යයි අප කියන විට පුද්ගලික අයිතිය අවසන් කිරීම අවශ්‍ය යයි අපි අදහස් නො කරමු. අපගේ භාෂාවෙන් අපගේ ආර්ථික සංවර්ධනය යනු ධනේශ්වර ප්‍රජාතාන්ත්‍රික විප්ලවයකි, එනම් වෙනත් වචනවලින් කියතොත් සාමූහිකකරනය, සාමාජිකකරනය සහ ජනසතුකරනය අපගේ වත්මන් න්‍යාය පත්‍රයේ නැත. මාඕවාදීන් බලයට පැමිනිවිට ආයෝජන පරිසරය වඩා හිතකර වනු ඇතැයි

සියලු දෙනාට සහතික වීමට අපි කැමැත්තෙමු. ඒ පිලිබඳ කිසිදු අනවශ්‍ය වැරදි අවබෝධයක් තබා ගැනීම අවශ්‍ය නැත."

ඒ හා සමාන පනිවුඩයක් ප්‍රකාශයට පත්කිරීමට ප්‍රචන්ඩ සහ භටරායි බදාදා, නේපාල වානිජ හා කර්මාන්ත මන්ඩල සම්මේලනය සමග පැය දෙකක හමුවක් පැවැත්වී ය. "වසර 10ක් ඇතුලත ඉන්ද්‍රජාලික ආර්ථික විප්ලවයක් සඳහා වැඩ කොට අපි මුලු ලොව ම විශ්මයට පත් කරමු," යයි ප්‍රචන්ඩ ව්‍යාපාරික නායකයින්ට කීවේ ය. "පුද්ගලික ආයෝජනවලට ඉඩදෙන අපි විදේශ ආයෝජන ද දිරිගන්වමු. විශ්වාසය නැති කර ගන්න එපා, අපි කර්මාන්ත අල්ලා ගැනීමට යත්න නො දරමු, ආර්ථික සමෘද්ධිය සඳහා අපට ඔබලාගේ සහයෝගය අවශ්‍ය ය."

"අදහස් හුවමාරුව ඇරඹුනේ ව්‍යාපාරිකයන් මාඕවාදීන්ගේ අපරාධ පිලිබඳව පැමිනිලි කරමින් ආතති සහගත කටයුත්තක් ලෙසිනි. එහෙත් එය අවසන් වූයේ රැස්වූවන්ගේ නිබඳ අත්පොලසන් සහිතව ප්‍රචන්ඩගේ බලාපොරොත්තු නො වූ 'ධනවාදී' කතාවක් සමගිනි..... ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් නො මනාපයන් සහ කාංසාවන් පලකිරීමෙන් පසු 'අපි 21 වන සියවසේ මාඕවාදීන් වෙමු' ප්‍රචන්ඩ ප්‍රකාශ කලේ ය. දූෂනය මර්දනය කිරීමට පොරොන්දු වෙමින් "ශක්තිමත් ජාතියක් ගොඩනැගීමට ශක්තිමත් හස්තයක් අවශ්‍ය ය" යයි ඔහු පැවසීය යනුවෙන් ඩීඑන්ඒ ඉන්දියා වෙබ් අඩවිය වාර්තා කලේ ය.

ප්‍රචන්ඩ සහ භටරායි, තමන් විදේශීය ආයෝජන දිරිගන්වන්නේ කෙසේදැ යි යන්නට මැලේසියාව හා දකුනු කොරියාව උදාහරන වසයෙන් දැක්වූහ. චීනය පිලිබඳව විමසූ විට "ආර්ථික වර්ධනය සඳහා ශක්තිමත් අඩිතාලමක් දැමූ මාඕගේ වැඩවසම් ක්‍රමය අහෝසි කිරීම" ගැන ප්‍රශංසාවෙන් භටරායි කතා කලේ ය. " රාජ්‍යය ප්‍රතිව්‍යුහගත කොට පුද්ගලික අංශය සම්බන්ධ කරගත් විට වේගවත් ආර්ථික වර්ධනයක් කරා ලඟාවීමට අපට පුලුවන."

මෙම අදහස් දැක්වීම් අත්‍යන්තයෙන් ම පැහැදිලි කරන්නේ සීපීඑන්-එම් පක්ෂයට සමාජවාදය සමග මොන ම සම්බන්ධයක් හෝ නැති බව හා එය කම්කරුවන්ගේ හෝ ග්‍රාමීය ජනයගේ අවශ්‍යතා නියෝජනය නො කරන බව ය. ඒ වෙනුවට එහි වැඩපිලිවෙල සන්නිවේදනය කරන්නේ නිදහස් වෙලඳපොල ප්‍රතිපත්ති අනුගමනය කිරීමට හා රට විදේශ ආයෝජනවලට විවෘත කිරීමට රාජාන්ඩුවේ අසමත්වීම කෙරෙහි නේපාල ව්‍යාපාරික ස්ථර අතර පවත්නා නොරිස්සුම යි.

ඔවැනි ආර්ථික පියවරවල් ජනගහනයේ බහුතරය මුහුනපාන සමාජ අර්බුදය විසඳනවා වෙනුවට පොහොසතුන් සහ දුප්පතුන් අතර සමාජ බෙදීම තව දුරටත් ගැඹුරු කරනු ඇත. චීනයේ දී මෙන් ම ප්‍රචන්ඩගේ "ශක්තිමත් හස්තය" අනිවාර්යයෙන් ම එල්ලවනු ඇත්තේ දූෂිත නිලධරයන් අතලොස්සකට එරෙහිව නොව ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම් සහ ශිෂ්ට සම්පන්න ජීවන තත්වයන් ඉල්ලා සිටින කම්කරුවන්ට හා ග්‍රාමීය ජනයාට විරුද්ධව ය.

## අස්ථාවරත්වයේ තර්ජනය

මාඕවාදීන් ආධිපත්‍යය දරන ආන්ඩුවක් කොතෙක් කල් පවතිනු ඇත් ද යන්න මෙන් ම එවැනි ආන්ඩුවක් පිහිටුවනු ලැබේ ද යන්න පවා විවෘත ගැටලු ය. 12 අවුරුදු ගොවි කැරලි මර්දනය කිරීමට අනුකම්පා විරහිත යුද්ධයක නිරතව සිට ඇති රජු හා හමුදාව මාඕවාදීන්ට ගැඹුරින් ම සතුරු ය. රාජාන්ඩුවට එරෙහිව පුලුල්ව පැතිර පවත්නා විරුද්ධත්වයේ තතු තුල ව්‍යවස්ථා සම්පාදක මන්ඩලය විසුරුවා හැර මිලිටරි පිටුබලය ලබන පාලනයක් පැටවීමට උත්සාහ දැරීමක් නො විය හැකි බව පෙනේ. එහෙත් එවැනි ක්‍රම අතීතයේ දී නිරන්තරයෙන් භාවිතා කරනු ලැබ ඇති අතර ඒවායේ හැකියාව සම්පූර්නයෙන් ඉවතහල නො හැකි ය.

තම හිටපු ගරිල්ලා භටයන් මිලිටරියට අන්තර්ග්‍රහනය කර ගන්නා ලෙස මාඕවාදීන් කරන බලපෑමට හමුදාව අත්‍යන්තයෙන් විරුද්ධ ය. වර්තමානයේ දී හිටපු සීපීඑන්-එම් සටන්කරුවන් 30,000කට ආසන්න ගනනක් දුෂ්කර කොන්දේසි මධ්‍යයේ විශේෂ භට කඳවුරුවල එක්සත් ජාතීන්ගේ අධීක්ෂනය යටතේ රඳවා තබා ඇති අතර එය මාඕවාදී නායකත්වය කෙරෙහි පුපුරනසුලු විභවයක් සහිත ගැටලුවකි. "ඔවුන් (සටන්කරුවන්) දැන් ම හමුදාවට අන්තර්ග්‍රහනය කරනු ලැබිය නො හැකි ය. ඔවුන්ව නිරායුධ කොට, විසුරුවා පුනරුත්ථාපනය කොට (සමාජයට තුලට) ප්‍රතිග්‍රහනය කරනු ලැබිය යුතු ය," යයි ජනතාවගේ බලය පිලිබඳව කටින් බතල හිටවන ගමන් හමුදා ප්‍රකාශක රමින්ද්‍රා චෙට්රි කීවේ ය.

සීපීඑන්-එම් පක්ෂය "ත්‍රස්තවාදී" සංවිධානයක් ලෙස හංවඩු ගැසූ බුෂ් පරිපාලනය ආයුධ හා පුහුනුව ලබාදෙමින් මාඕවාදීන්ට එරෙහි යුද්ධයට නේපාල හමුදාවට පිටුබලය ලබා දුන්නේ ය. 2006 අප්‍රේල් මාසයේ දී රජුට සහයෝගය දැක්වීම අවසාන මොහොතේ ඉවත් කරගත් වොෂින්ටනය එම වසරේ පසු භාගයේ දී සීපීඑන්-එම් පක්ෂය අන්තර්වාර ආන්ඩුවේ කොටසක් බවට පත්වීමෙන් පසුව ද එය තම ත්‍රස්තවාදී සංවිධාන ලැයිස්තුවේ දිගට ම තබා ගත්තේ ය. මැතිවරනය සාදරයෙන් පිලිගන්නා අතර ම මාඕවාදී නායකත්වයෙන් යුත් ආන්ඩුවක් තැනීම පිලිබඳව එක්සත් ජනපදය තවමත් කිසිදු ප්‍රකාශයක් කොට නැත.

2006 වසරේ පලස්තීන මැතිවරනයෙන් ඉස්ලාමීය හමාස් පක්ෂය ජයග්‍රහනය කිරීමෙන් පසු එයට එරෙහිව

බුෂ් පරිපාලනය යෙදූ යන්ත්‍රනයන් නේපාල මාඕවාදීන්ට එරෙහිව අස්ථාවරකාරී ව්‍යාපාරයක් දියත් කිරීම ධවල මන්දිරයට හොඳින් ම කල හැකි බවට අනතුරු ඇඟවීමකි. නේපාල මැතිවරනය නීති විරෝධී බවට තමන් සලකන්නේ යයි ඇමරිකානු මාධ්‍ය දැනට ම ඉඟි කරමින් සිටිති. ජාත්‍යන්තර නිරීක්ෂකයන් ඡන්ද විමසීම සාමාන්‍යයෙන් "නිදහස් හා සාධාරන" යයි විස්තර කලත් වෝල් ස්ට්‍රීට් ජර්නල් හි සඳුදා පලවූ ලිපියක් මාඕවාදීන්ගේ මැතිවරන ප්‍රචන්ඩත්වයට අවධානය යොමු කල අතර ජනයා සීපීඑන්-එම් පක්ෂයට ඡන්දය දුන්නේ එම ගරිල්ලන් යලි යුද්ධයට අවතීර්න වීමෙන් වැලැක්වීමට යයි අසාමාන්‍ය තර්කයක් ගොඩ නැංවී ය.

ඉන්දියාව සහ චීනය අතරත් බලශක්තියෙන් පොහොසත් මධ්‍යම ආසියානු කලාපයට ආසන්නවත් භූලෝපායික ප්‍රදේශයක නේපාලය පිහිටා ඇත. මාඕවාදීන්ට එරෙහි යුද්ධයට බුෂ් පරිපාලනය සහය දැක්වීමේ එල්ලය වූයේ ප්‍රතිමල්ලව චීනය කොටු කිරීමේ පුලුල් භූලෝපායක කොටසක් ලෙස කුඩා හිමාලයානු රාජ්‍යය තුල එක්සත් ජනපදයේ ආනුභාවය ඉහල දමා ගැනීම යි. නේපාලය තුල බීජිංහි බලපෑම මොන ම අකාරයකින් හෝ ඉහල යාම මාඕවාදීන්ට වල කැපීම සඳහා කටයුතු කිරීමට වොෂින්ටනයට බල කරනු ඇත. ඒ අතර ම සීපීඑන්-එම් පක්ෂය සම්මුතියක් අපේක්ෂාවෙන් පසු වේ. ප්‍රචන්ඩ පසුගිය සති අන්තයේ දී මැතිවරනය නිරීක්ෂනය කිරීම සඳහා නේපාලයට පැමින සිටි හිටපු ඇමරිකානු ජනාධිපති ජිමී කාටර් සමග දීර්ඝ සාකච්ඡාවක නිරත වීමට අවස්ථාව උදා කරගත්තේ ය.

නේපාලය පිලිබඳ චීනයේ ප්‍රතිපත්තිය මුලුමනින් ම තත්කාර්යවාදී ය. මාඕවාදී කැරැල්ලට සහයෝගය දෙනවා වෙනුවට බීජිනය කලේ කැරලිකරුවන්ව හෙලා දැක නේපාල මිලිටරියට ආයුධ සැපයීම යි. අනෙක් රටවලට මෙන් ම චීනයට ද වික්ෂිප්ත මැතිවරන ප්‍රතිඵලයෙන් පසුව තම ප්‍රවිෂ්ටය ගලපා ගැනීමට සිදුවනු ඇත. "චීනය අසහනකාරී ටිබෙට් රට ආසන්නයේ පිහිටි තම භූලෝපායික හිමාලයානු කලාපය තුල තම අවශ්‍යතා ශක්තිමත් කර ගනිමින් සිටී. චීන සමාගම් නේපාලයේ ග්ලැසියර ගංගා ජල විදුලිය නිපදවීම සඳහා යොදා ගැනීමේ ලාභදායී ගනුදෙනු ආක්‍රමනික ලෙස හඹායන්නේ රාජ්‍ය නිලධාරීන් කත්මන්ඩු නුවර දී මාඕවාදීන්ව උනුසුම් කරන අතරේ ය," යයි ටයිම් සඟරාව අවධාරනයෙන් සටහන් කලේ ය.

අනෙක් ප්‍රධාන කලාපීය බලවතා වන්නේ දීර්ඝ කාලයක් පුරා නේපාලය තම වැයික්කියේ කොටසක් ලෙස සලකන ඉන්දියාව යි. නේපාලය තුල මාඕවාදී ප්‍රචාරයේ එක් හුයපටක් නිරන්තරයෙන් "ව්‍යාප්තවාදී" ඉන්දියාවට එරෙහිව යොමු කරනු ලැබ ඇත. දෙරට අතර නිදහස් වෙලඳම හා ජනයාගේ නිදහස් සංක්‍රමනය සඳහා අවසර දෙමින් 1950 දී අත්සන් කෙරුනු ඉන්දු-නේපාල ගිවිසුම ඉරා දමන බවට සීපීඑන්-එම් පක්ෂය පූර්වයෙන් පොරොන්දු විය. නේපාල පාලක ප්‍රභූවේ කොටස් එම ගිවිසුම නව දිල්ලියට ම දේශපාලන හා ආර්ථික බලපෑම යෙදීමට ඉඩ ලබාදෙන ලීවරයක් ලෙස දීර්ඝ කාලීනව සලකා ඇත. ගොඩබිමින් වටව ඇති නේපාලයට ඇත්තේ සීමිත වෙලඳ හා ප්‍රවාහන විකල්පයන් පමනි.

පක්ෂ හතේ සංධානය සහ මාඕවාදීන් අතර සම්මුතියක් ඇටවීමේ දී ඉන්දියානු ආන්ඩුව ප්‍රධාන භූමිකාවක් ඉටුකල නමුත් එහි ප්‍රතිඵලය මාඕවාදීන් ප්‍රධානත්වය දරන ආන්ඩුවක් වේ යයි කිසිවිටෙක අපේක්ෂා කලේ නැත. නේපාලයේ කැරලිකාරීත්වය අවසන් කිරීමට නව දිල්ලියට තිබූ උවමනාවට එක් හේතුවක් වූයේ ඉන්දියාවේ ප්‍රදේශ බොහෝ ගනනක ඇති මාඕවාදී ගරිල්ලා ව්‍යාපාර මැඩලීම යි. තම රටේ ග්‍රාමීය ප්‍රදේශවල අසහනය දිරිමත් කරන ඕනෑම දෙයක් පිලිබඳව මෙන් ම කත්මන්ඩු තුල ප්‍රතිමල්ලව පාකිස්තානයේ හා චීනයේ අනුහස කිසිදු ලෙසකින් හෝ වැඩීම පිලිබඳව ඉන්දියාව තියුනු ලෙසින් සංවේදී වනු ඇත.

ඉන්දියානු කාංසාවන් සමහන් කිරීමට ප්‍රචන්ඩ වහ වහා යුහුසුලු විය. භූගෝලීය, සංස්කෘතික හා ඓතිහාසික හේතූන් නිසා නේපාලයට ඉන්දියාව සමග "විශේෂ සබඳතාවක්" ඇතැයි බඳාදා මාඕවාදී නායකයා යලි සපථ කලේ ය. තමන් අඟහරුවාදා ම "නව දිල්ලියේ නිලධාරීන් සමග දීර්ඝ සහ ගැඹුරු සාකච්ඡා" පැවැත්වූ බව ඔහු හෙලිදරවු කලේ ය. ඉන්දියානු විදේශ ඇමති ප්‍රනාබ් මුකර්ජි දුරකථන සාකච්ඡාවක දී නව දිල්ලියේ සංචාරය කරන ලෙස ප්‍රචන්ඩට ඇරයුම් කලේ ය.

රාජ්‍යතාන්ත්‍රික සංවාදයන් හුවමාරු කරගැනීමට ඔබ්බේ ආතතීන් තව දුරටත් පවතී. "මෙම තීරනාත්මක අවස්ථාවේ දී පාරිභෝගික සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සම්පාදනය කිරීමට බලපෑමක් එල්ල වුවහොත් එය නේපාල-ඉන්දියානු සබඳතාවලට දීර්ඝකාලීනව බලපානු ඇත," ප්‍රචන්ඩ අවධාරනයෙන් පැවසී ය. මෙම අදහස් දැක්වීම නේපාලය චීනයෙන් ආයුධ මිලට ගැනීමට උත්සාහ කල විට එරටට එරෙහිව ඉන්දියාව වෙලඳ සම්බාධක පැනවීම නිසා එරටෙහි ආර්ථිකය මත ව්‍යසනකාරී බලපෑමක් ඇති වී යෝධ උද්ධමනයකට මග පෑදූ 1988 වර්ෂයේ සිද්ධි යලි මතකයට නංවයි.

පසුගිය සතියේ මැතිවරන ප්‍රතිඵලය රටෙහි දේශපාලනික හා සමාජ අස්ථාවරභාවය තව දුරටත් සංකීර්න කරනු ඇත්තා වූ රාජ්‍යතාන්ත්‍රික උපාමාරුවල තෝතැන්නක් බවට කත්මන්ඩුව පරිවර්තනය කරනු ඇතැයි යන්න නිසැක ය.

© www.wsws.org